**හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 17 - 2023**
**--------------------------------------------------------------------------------**

**1. විගණන මතය**

1.1 හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 17 හි 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 17 කට අදාළව විගණන වාර්තා නිකුත් කර තිබුණු අතර එම වාර්තාවල කාරක සභා 01 ක් සඳහා අහිතකර මතයක් සහ කාරක සභා 16 ක් සඳහා තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කිරීම සඳහා හේතු වී තිබුණු ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වලස්මුල්ල ගොවිජන සේවා කාරක සභාවේ ස්ථාවර තැන්පතු වටිනාකම රු. 1,845,981 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂයේ ගිණුම් වාර්තා වල නිවැරදිව දැක්වීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන සම්පූර්ණ හා නිවැරදිව පිළියෙල කර ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 12 ක සමාලෝචිත වර්ෂයට අදාළ විවිධ විෂයන්ට අයත් වියදම් රු.1,672,277 ක් වැඩියෙන් සහ රු.673,425 ක් අඩුවෙන්ද ගොවිජන සේවා කාරක සභා 08 ක විවිධ විෂයන්ට අදාළ ආදායම් රු.317,113 ක් අඩුවෙන් සහ රු.1,263,365 ක් වැඩියෙන්ද, ගොවිජන සේවා කාරක සභා 16 ක ජංගම වත්කම් රු.1,799,778 ක් අඩුවෙන් සහ රු.422,564 ක් වැඩියෙන්ද, ගොවිජන සේවා කාරක සභා 08 ක ජංගම වගකීම් රු.76,048 ක් අඩුවෙන් සහ රු.3,483,160 ක් වැඩියෙන්ද, ගොවිජන සේවා කාරක සභා 11 ක සමුච්චිත අරමුදල රු. 1,845,100 ක් අඩුවෙන් සහ රු. 304,638 ක් වැඩියෙන්ද, ගොවිජන සේවා කාරක සභා 08 ක ප්‍රත්‍යාගණන සංචිතය රු. 2,585,889 ක් අඩුවෙන්ද ගිණුම්ගත කර තිබුණි. | මෙම දෝෂයන් 2024 වර්ෂයේ ගිණුම් වාර්තා වල නිවැරදිව දැක්වීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගිණුම් වර්ෂයට අදාළ ආදායම් හා වියදම් ගැලපීමටත්, මූල්‍ය ප්‍රකාශන සම්පූර්ණව හා නිවැරදිව ඉදිරිපත් කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 15 ක ස්ථාවර වත්කම් වටිනාකම රු.9,541,186 ක් අඩුවෙන් සහ රු.54,000 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණු අතර කාරක සභාව පිහිටි ඉඩම්වල වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර | මධ්‍යස්ථානවල ඉඩම් පවරා ගැනීමට කටයුතු කරමින් පවතින බව හා අනෙකුත් දෝෂයන් 2024 වර්ෂයේ ගිණුම් වාර්තාවල නිවැරදිව | කාරක සභාවට අයත් සියලු වත්කම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතු අතර මූල්‍ය ප්‍රකාශන සම්පූර්ණව හා නිවැරදිව ඉදිරිපත් |

| | | |
|---|---|---|
| නොතිබුණි. | දැක්වීමට කටයුතු කරන බව. | කිරීමට කටයුතු කළ යුතුය. |

**1.3.2 අධිකාරී බලය නොලත් ගනුදෙනු**

| | අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බෙලිඅත්ත ගොවිජන සේවා කාරක සභාව විසින් පෞද්ගලික ආයතනයක් මගින් ණය පදනම මත මිලදීගෙන තිබුණු රු. 3,431,875 ක් වටිනා පොහොර තොගය වෙනුවෙන් ගෙවීම් කිරීමේදී ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්ගේ අනුමැතිය රහිතව කාරක සභාවේ විධායක ලේකම් විසින් තම අධිකාරී සීමාව ඉක්මවා ගෙවීම් වවුචර් පත් 05 ක් පිළියෙල කර රු. 225,550 ක් ගෙවීම් කර තිබුණි. | පොහොර වර්ග වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් චෙක්පත් නිකුත්කර ඇති බව. | සීමාව ඉක්මවා ගෙවීම් කිරීමේදී ගොවිජන සේවා සංවර්ධන කොමසාරිස්ගේ අනුමැතිය ලබාගත යුතුය. |
| (ආ) | බෙරලිහෙල ගොවිජන සේවා කාරක සභාව විසින් මයිලෝ මීටරය ක්‍රියාවිරහිත වී තිබුණු ෂයින් 504 ට්‍රැක්ටර් රථය රියදුරු ලෙස බාහිර පාර්ශවයක් යොදවා කුලියට දීම සිදුකර තිබුණද විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි. ට්‍රැක්ටර් රථයේ රියදුරු විසින්ම ඉන්ධන ලබාගෙන එම බිල්පත් හා කරන ලද සුළු අලුත්වැඩියා වියදම් සඳහා වූ බිල්පත් කාරක සභාවට ඉදිරිපත් කිරීමේදී වියදම් බිල්පත් වලට අදාළ මුදල් අඩුකර ආදායම කාරක සභාවට ලබාදී තිබුණි. ඒ අනුව ඉන්ධන ලබාගැනීමේදී හා අලුත්වැඩියා කටයුතු සඳහා සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් රු. 330,892 ක් සහ රු. 130,226 ක් දරා තිබුණ ද මෙය වගකිය යුතු නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ සිදුකර නොතිබුණි. | මයිලෝමීටරය සකස් කිරීමට අමතර කොටස් නොමැති බවත්, රියදුරු සමඟ ගිවිසුමකට එළඹීමට කටයුතු කරන බව හා නිවැරදි ක්‍රමවේදයන් අනුව කටයුතු කිරීමට හා අධීක්ෂණය කිරීමට කටයුතු කරන බව. | මෙ෦ සම්බන්ධයෙන් වි෦ධිමත් පාලන පද්ධතියක් හඳුන්වාදිය යුතුය. |
| (ඇ) | අම්බලන්තොට ගොවිජන සේවා කාරක සභාවේ ඉතිරි කිරීම් ගිණුම් දෙකක පැවති රු. 50,121 ක ශේෂ අනුමැතියකින් තොරව කපා හැර තිබුණි. | බැංකුවෙන් සනාථන ලිපි ලබාගෙන ශේෂයන් කපාහැර ඇති බව. | අනුමැතිය ලබාගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.3.3 විගණන සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 17 ක රු.167,355,451 ක් වූ වත්කම්, ගොවිජන සේවා කාරක සභා 08 ක රු.76,133,928 ක් වූ වගකීම් සහ ගොවිජන සේවා කාරක සභා 02 ක රු.1,112,643 ක් වූ ආදායම් ගණුදෙනු සත්‍යාපනය සහ සත්‍යාපනය කිරිමට අවශ්‍ය ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | 2024 ගිණුම් වාර්තාවල නිවැරදිව තොරතුරු ඉදිරිපත් කිරිමට අවශ්‍ය සටහන්, වාර්තා, ලේඛන ඇතුලත් කරන ලෙස ප්‍රාදේශීය නිලධාරීන්ට ලිඛිතව උපදෙස් ලබාදීමට කටයුතු කරන බව. | ආදායම් සනාථ කිරීම හා වත්කම් සහ වගකීම් ශේෂ තහවුරු කර ගැනීමට අදාළ සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

### 1.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත<br>-------------------------- | | | |
| i. 51(1) වගන්තිය | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් යම් ප්‍රදේශයක් සඳහා ගොවිජන සංවර්ධන සභාවක් ස්ථාපනය කිරීමට ක්‍රියාකළ යුතු වුවද ගොවිජන සේවා කාරක සභා 17 ක ගොවිජන සංවර්ධන සභා පිහිටුවා නොතිබුණි. | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙතින් උපදෙස් ලැබී නොමැති අතර ඒ සඳහා උපදෙස් ලද වහාම ගොවිජන සංවර්ධන සභා පිහිටුවීමට කටයුතු කරන බව. | පනතේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| ii. 56(3) හා (4) වගන්ති | ගොවිජන සේවා කාරක සභා 09 ක වගකිව යුතු නිලධාරීන් විසින් සමාලෝචිත වර්ෂය අවසානයේදී රු. 1,503,805 වූ හිඟ අක්කර බදු අයකර ගෙන නොතිබුණි. | හිඟ අක්කර බදු අයකර ගැනීමට අදාළ නිලධාරීන් දැනුවත් කර ඇති බව. | පනතෙහි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>--------------------------- | | | |
| i. මුදල් රෙගුලාසි 110 | ගොවිජන සේවා කාරක සභා 10 ක හානි හා පාඩු සම්බන්ධයෙන් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | හානි හා පාඩු ලේඛන පවත්වාගෙන යාමට කටයුතු කරන බව. | ලේඛන යාවත්කාලීනව පවත්වාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| ii. මුදල් රෙගුලාසි 133 හා 134 | අම්බලන්තොට ගොවිජන සේවා කාරක සභාවේ අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | ඉදිරියේදී විගණනයක් සිදුකිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| iii. මුදල් රෙගුලාසි 396(ඈ) | ගොවිජන සේවා කාරක සභා 03 ක් විසින් නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ කල් ඉකුත් වූ එකතුව රු. 17,631 ක් වූ චෙක්පත් 05 ක් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්ගේ උපදෙස් පරිදි ඉදිරි කටයුතු සිදු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| iv. මුදල් රෙගුලාසි 454 (2) | ගොවිජන සේවා කාරක සභා 08 ක විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | ලේඛන ආරම්භ කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| v. මුදල් රෙගුලාසි 880 | ගොවිජන සේවා කාරක සභා 15 ක මුදල් හෝ තොග සම්බන්ධයෙන් ක්‍රියාකිරීම සඳහා බලය ලබාදී ඇති සියලුම සේවකයින් විසින් ඇප තැබිය යුතු වුවද කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් විසින් ඇප තබා නොතිබුණි. | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙත යොමුකර ඉදිරි කටයුතු සිදුකරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

(ඇ) ගොවිජන සේවා කොමසාරිස්ගේ 1981 ඔක්තෝබර් 16 දිනැති අංක 107 දරන චක්‍රලේඛය
---------------------------

| | | | |
|---|---|---|---|
| i. 03 (ඉ) වගන්තිය | සියළුම ගනුදෙනු නියමිත ගිණුම් පොත්වල ක්‍රමවත්ව සහ කලට වේලාවට ඇතුළත් කළ යුතු වුවද ගොවිජන සේවා කාරක සභා 05 ක් විසින් එසේ කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී ක්‍රමවත්ව කලට වේලාවට ගිණුම් පොත්වල සටහන් කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 754/9/05 (මෙහෙ.පො) දරන 2023 අප්‍රේල් 26 දිනැති ලිපිය | ගොවිජන සේවා කාරක සභා 03 ක සුළු මුදල් අග්‍රිම සීමාව වන රු. 20,000 සීමාව ඉක්මවා අවස්ථා 09 කදී රු. 252,400 ක් සුළු මුදල් අග්‍රිම ලෙස ලබාගෙන තිබුණු අතර අවස්ථා 43 කදී සුළු මුදල් වියදම් සීමාව ඉක්මවා රු. 359,540 ක් සුළු මුදල් වියදම් ලෙස ගෙවා තිබුණි. | ඉදිරි කටයුතු වලදී අදාළ ලිපිය අනුව කටයුතු කිරීමට දැනුවත් කළ බව. | අදාළ නීතිරීති අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2023 වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 11 ක එකතුව රු.10,891,164 ක අතිරික්තයක්ද, ගොවිජන සේවා කාරක සභා 06 ක එකතුව රු. 2,514,732 ක ඌනතාවයක්ද ගොවිජන බැංකු 17 ක එකතුව රු. 6,517,427 ක ශුද්ධ ලාභයක්ද, විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාරක සභා බල ප්‍රදේශයේ සුළු වාරිමාර්ග වැව්වල ජල ධාරිතාවය මැනීම සඳහා ලබාදී තිබුණු ජල උස මාපක 80 ක් ගොවිජන සේවා කාරක සභා 04 ක් විසින් අදාළ අරමුණු සඳහා යොදවා නොතිබුණි. | මෙම උපකරණ සුළු වාරිමාර්ග වැව්වල ජල ධාරිතාව මැනීමට නිකුත් කිරිමට කටයුතු කරන බව. | අදාළ උපකරණ අරමුණුගත කාර්ය සඳහා භාවිතා කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 04 ක් විසින් 2021/2022 මහ කන්නයේ හා 2022/2023 මහ කන්නයේ පරිසර හිතකාමී කාබනික පොහොර නොමිලේ බෙදා හැරීමේ වැඩසටහන් යටතේ ගොවීන් වෙත බෙදා හැරීමට රජය විසින් ලබාදී තිබුණු රු.4,309,422 ක් වටිනා පොහොර තොග ගොවීන් වෙත නිකුත් නොකර රඳවාගෙන තිබුණි. | සැපයුම්කාර ආයතන වෙත නැවත මෙම පොහොර තොග යැවීමට කටයුතු කරන බව. | පොහොර තොග අවශ්‍ය ප්‍රමාණයන් ඇණවුම් කළ යුතු අතර එම තොග නිවැරදිව බෙදා හැරීම කළ යුතුය. |
| (ඇ) | වීරවිල ගොවිජන සේවා කාරක සභාවේ 2016 වර්ෂයේදී ගබඩාවේ පැවති රු. 273,234 ක පොහොර තොගයක් අස්ථානගත වීමට අදාළ අලාභය අයකර ගැනීම සඳහා ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් 2022 සැප්තැම්බර් 13 දිනැති අංක 7/2/10/1855 දරන ලිපිය මගින් නියෝග කර තිබුණු නමුත් වගකිව යුතු නිලධාරීන් විසින් එම අලාභය අයකර නොතිබුණි. | එක් නිලධාරියෙකු විසින් අභියාචනා කර ඇති බැවින් අයකර ගැනීමට නොහැකි වූ බව. | වගකිව යුතු නිලධාරීන්ගෙන් මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පිරිවැය රු. 444,024 ක කල් ඉකුත් වූ කෘෂි රසායන, එළවළු බීජ, බිත්තර වී සහ රසායනික පොහොර, වෙනත් පොහොර හා කෘෂි උපකරණ තොග සම්බන්ධයෙන් ගොවිජන සේවා කාරක සභා 04 ක් විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | තොග කපා හැරීම සඳහා සහකාර කොමසාරිස්ගේ අනුමැතිය ඉල්ලීම් කර ඇති බව. | කල් ඉකුත් වීමට පෙර විකිණීමට හෝ ආපසු යැවීමට කටයුතු කළ යුතු අතර, එසේ කටයුතු නොකළ වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 04 ක මිලදීගෙන තිබුණු රු. 1,440,600 ක කාබනික පොහොර කිලෝග්‍රෑම් 50353 ක් හා මයුරපුර ගොවිජන සේවා කාරක සභාව විසින් මිලදීගෙන තිබුණු රු. 44,850 ක් වූ එප්පාවල රොක්පොස්පේට් (ERP) පොහොර කිලෝග්‍රෑම් 3450 නිෂ්කාර්යව ගබඩාවේ රඳවා තිබුණි. | රජය විසින් මුදල් ගෙවා ඇති බැවින් ආපසු යැවීමට කටයුතු නොකරන ලදී. කාරක සභා අතර මාරුකර අලෙවි කිරීමට කටයුතු කරන බව. | කල් ඉකුත් වීමට පෙර විකිණීමට හෝ ආපසු යැවීමට කටයුතු කළ යුතු අතර, එසේ කටයුතු නොකළ වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | යෝධකණ්ඩිය ගොවිජන සේවා කාරක සභාව විසින් පෞද්ගලික සමාගමක් වෙත අලෙවිකර තිබුණු ඝන කාබනික පොහොර කිලෝග්‍රෑම් 18480 කට අදාල රු.369,600 ක සඳහා මුදල් 2024 අප්‍රේල් 30 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | මුදල් අයකර ගැනීමට සිහිකැඳවීම් යවන බව හා අදාළ නීතිමය කටයුතු සිදුකරන බව. | වගකිව යුතු නිලධාරීන්ගෙන් මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය |

**3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 10 කට අයත් ගොවිජන සංවර්ධන නිලධාරී නිල නිවාස 10ක්, අලෙවිසැලක්, සීසීටීවී කැමරා පද්ධතියක්, ට්‍රැක්ටර් 06ක්, ට්‍රැක්ටර් ටේලර් 02 ක්, සේප්පු 01ක් , ෆැක්ස් යන්ත්‍ර 01ක්, යතුරු පැදි 01ක්, නගුල් 01ක්, කාබනික අතු කැබලි යන්ත්‍රයක්, කාබනික පොහොර නිෂ්පාදන යන්ත්‍ර 01ක් නිශ්කාර්යව පැවතුණි. | ගොවිජන සංවර්ධන නිලධාරී නිවාසයන් සහ පොහොර ගබඩා අලුත්වැඩියා කිරීම සඳහා කාරක සභාව සතුව ප්‍රමාණවත් මුදල් නොමැති බැවින් අලුත්වැඩියා කිරීම සඳහා වියදම් ඇස්තමේන්තු සහ ප්‍රතිපාදන හම්බන්තොට දිස්ත්‍රික් කාර්යාලයෙන් ඉල්ලීම් කර ඇති බව හා අනෙකුත් වත්කම් අවශ්‍යතාවය අනුව අලුත්වැඩියා කිරීමට උපදෙස් ලබාදෙන බව. | භාවිතයට ගතහැකි වත්කම් හා උපකරණ උපයෝජනයට ගැනීමටත් අනිකුත් වත්කම් හා උපකරණ අපහරණය කිරීමටත් කටයුතු කළ යුතුය. |

**3.5 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 09 ක් විසින් 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 වගන්තියට අනුකූල නොවන ලෙස අවස්ථා 121 කදී රු. 5,410,281 ක බිත්තර වී, ලිපි ද්‍රව්‍ය හා කාර්යාල උපකරණ මිලට ගෙන තිබුණි. | ඉදිරියේදී මෙම දෝෂයන් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.6 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 17 කට අයත් වසම් 196 ක් සඳහා කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරීන්ගේ පුරප්පාඩු පැවතුණි. | පුරප්පාඩු වසම් සඳහා වැඩ බැලීමේ පත්වීම් ලබා දීමට කටයුතු කර ඇති බව. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |

**4. ගොවිජන බැංකු කටයුතු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවි බැංකු 12 මඟින් ගොවීන් වෙත ලබාදී තිබුණු ණය වලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු. 61,829,306 ක අක්‍රීය ණය ශේෂ සහ පොලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ණය මුදල් හා පොලී අයකර ගැනීම සඳහා ගොවිජන විනිශ්චය සභා තීරණය අනුව නඩු පැවරීමට කටයුතු කරන බව. | හිඟ ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | නෙටොල්පිටිය ගොවිජන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණු රු.130,404 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය නිරවුල් කර නොතිබුණි. | එම ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කරන බව. | ශේෂයන් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන නිවැරදි කළ යුතුය. |